**වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

**ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු බල ප්‍ර දේශයේ ඇති සුසාන භූමි 13 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | සුසාන භූමි 13 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ආ) | පන්ඩත්තරිප්පු උප කාර්යාල ප්‍රදේශයේ රු.880,625 ක පිරිවැයකින් ඉදිකළ සති වෙළඳපොළ සංකීර්ණයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | සති වෙළඳපොළ සංකීර්ණයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුවේ. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | සභාවට අයත් වාහන 13 ක් වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් වාහන හා සයිකල් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | වාහන 13 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුවේ. | වාහන 13 ක් වටිනාකම් තක්සේරු කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. |

**1.4** **අසම්භාව්‍ය බැරකම්**

2018 දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයකට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරී |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් 2013 දෙසැම්බර 06 දින බදු දී තිබූ කාක දූපත වෙළෙඳපොල කඩකාමර බදු රු. 275,508ක් බදුකරුගෙන් වර්ෂ 3ක සිට අයකර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් අංක 92/15 යටතේ නඩුවක් පවරා 2015 දෙසැම්බර් 04 දින සිට විභාග වෙමින් පැවැතිම නිරීක්ෂණය වූ අතර මේ සඳහා වූ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | මින් ඉදිරියේදි නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරිමට කටයුතු කර ඇත. |
| (ආ) | කල්ලුන්ඩායි සන අපද්‍රව්‍ය රැස්කිරිමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් සභාවට ඒරෙහිව අංක AR/175/15 දරන නඩුව පවරා තිබූ අතර මේ සඳහා වූ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | මින් ඉදිරියේදි නඩු වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරිමට කටයුතු කර ඇත. |

**1.5** **අනුකූල නොවීම**

**1.5.1** **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | කාර්යසාධන වාර්තාව සකස් කළ නමුත් දොෂයකින් ඇමිණීමට නොහැකි විය. |
| (ආ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | රු.14,549,915 ක් වටිනා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයන්ට ලේකම්වරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | වරෙන්තු නිකුත් කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු. 129,816 ක් වටිනා වර්ෂ2ක් ඉකුත් වු තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව නිරවුල් කළ යුතු වේ. | අදාල ඇප මුදල නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 චක්‍රලේඛය | වගකීම් පවරා ඇති නිලධාරීන් 21 දෙනෙකු විසින් ඒකතුව රු.116,000ක ඇප මුදල් ගෙවා නොතිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඇප මුදල් අයකිරීමට කටයුතු කර ඇත. |

**1.5.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වේ. | **ප්‍රසිද්ධ වෙන්දේසි මගින් කරනු ලබන විකිණීම්වලදී අයකරනු ලබන අතැර කොමිස්කරුවන් මගින් විකුණනු ලබන ඉඩම් සම්බන්ධයෙන් අයකිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.** |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.75,228,272 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 50,399,647 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,859,600 | - | 8,052,726 | 14,549,915 | 7,857,820 | - | 8,808,665 | 12,059,285 |
| කුලී | 10,233,300 | - | 11,928,676 | 279,758 | 9,782,649 | - | 10,358,209 | 283,508 |
| බලපත්‍ර ගාස්තු | 2,930,700 | - | 3,476,268 | 28,500 | 2,425,256 | - | 2,907,748 | 28,500 |
| වෙනත් ආදායම් | 116,186,200 | - | 124,153,988 | 49,990,569 | 100,118,830 | - | 86,428,710 | 142,460,738 |
| එකතුව | **137,209,800** | **-** | **147,611,658** | **64,848,742** | **120,184,555** | **-** | **108,503,332** | **154,832,031** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු. 108,503,332 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.147,611,658 කින් වැඩි වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.39,108,326කින් වැඩි වී තිබුණි.<br>එසේ වුවත්, ආදායම් බිල් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | ඉදිරි වර්ෂවලදී බිල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් හා බදු රු.14,549,915 ක් අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් හා බදු සියල්ල අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ආදායම්නිලධාරීන් පත්කර හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමින් පවතී. |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හිඟ බදු කුලී රු.275,508 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී සියල්ල අයකිරීමට කටයුතු කළ යුතු වේ. | වෙළෙඳපොළ හිඟ බදු කුලී රු.275,508 ක් අයකිරීමටනඩු පවරා ඇත. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වෙළඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර ගාස්තු රු.12,500 ක් හිඟ හිටව පැවතුණද මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු සම්පූර්ණයෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ රු.6,000 ක්වූ විදුලි සංදේශ කුළුණු බලපත්‍ර ගාස්තු සහ ඉදිකිරීමේ ගාස්තු අයකර ගෙන නොමැතිව හිඟ හිටව පැවැතිණි. | හිඟ හිටව පවතින විදුලි සංදේශ කුළුණු බලපත්‍ර ගාස්තු සහ ඉදිකිරීමේ ගාස්තු සම්පූර්ණයෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.2.6 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.11,275,138 ක් සහ මුද්දර ගාස්තු රු.38,715,431ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ ගාස්තු සහ හිඟ මුද්දර ගාස්තු මුදල් සම්පූර්ණයෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාල නිලධාරීන්ට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරුණු පහත සඳහන් පරිදි විය.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 22 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සියළුම ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට සකස් කිරීමට කටයුතු කෙරේ. |

#### (ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පිරාන්පත්තු සතිපොළ ඉදිකිරිම සඳහා වැයකළ රු.880,625 කින් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කරගෙන තිබුණද, වර්ෂ 03ක සිට සතිපොල භාවිතා කර නොතිබූ හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වී තිබුණි. | අදාල සතිපොළ භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල සතිපොළ වෙනත් අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කරමින් පවතී. |

#### (ඇ) අතහැර දැමූ කාර්යයන්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවල ඝන අපද්‍රව්‍ය බැහැර කිරිම සහ සාතකාගාරය ඉදිකිරීම කර්මාන්තයන් සඳහා රු.4,085,815ක් වැය කර තිබුණත්, 2014 පෙබරවාරි මාසටයේ සිට ජාතික ආරක්ෂක අරමුණු සඳහා අදාල ඉඩම | අදාල කර්මාන්තයන් නියමිත ස්ථානයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

අත්කර ගැනීම නිසා 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂා කළ ප්‍රතිඵල ලඟාකර ගත නොහැකිව එම ක්‍රියාකාරකම් අතහැර දමා තිබුණි.

**(ඈ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරකම් 07 ක් ආරම්භ කළ යුතු දිනයේ ගිවිසුම් අතසන් කර තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | ක්‍රියාකාරකම් නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

**(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කළ දිගුකාලීන හා කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 76,900ක් වැයකර තිබුණ අතර ආදායම් ලෙස රු.446,510ක් උපයාගෙන තිබුණි. | ආදායම් වැඩිකර ගැනීමටත් වියදම් අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ii) | කාක දූපතේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මෙම ප්‍රදේශය තෝරා ගෙන තිබූ නමුත් ජාතික ප්‍රතිපත්තිය අනුව ඝන අපද්‍රව්‍ය වෙන් නොකර රැස්කරනු ලබන අතර දෛනිකව එකතු වන නොතිබුණි. | ජාතික ප්‍රතිපත්තිය අනුව ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කළ යුතු අතර කසල කැබැලි කර පස් දමා වසා දැමිය යුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේදී සියළුම සෞඛ්‍ය කම්කරුවන් සඳහා වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඊ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදි නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදි තිබූ ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදුන් රු. 220,000 ක සහනාධාර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ප්‍රජා මධ්‍යස්ථානවල සහනාධාර නියමිත කාලයේ අදාල අවශ්‍යතා සඳහා භාවිතා කළ යුතුය. | ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ගිණුම්වල ඇති රු.122,713,429 ක් ප්‍රදේශයේ සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | ස්ථාවර තැන්පතු ගිණුම්වල ඇති අරමුදල් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ සංවර්ධන කාර්යයන් සිදුකරමින් පවති. |
| (ඇ) | පසුගිය වසර 40ක් පුරාම පන්ඩකරිප්පු පට්ටිනම් සහ පන්ඩකරිප්පු ප්‍රාදේශයේ පිහිටි දේපළ බදු සඳහා නැවැත තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. | දේපළ බදු සඳහා නැවැත තක්සේරු කිරීම් සිදු කළ යුතු වේ. | දේපළ නැවැත තක්සේරු කිරිමට කටයුතු කෙරේ. |
| (ඈ) | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු නොවී පැවැතුණි. | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. | අදාල නිලධාරියාට මෙම කරුණ සම්බන්ධයෙන් උපදෙස් ලබාදි ඇත. |

| | | |
|---|---|---|
| (ඉ) ප්‍රාදේශීය සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | මහජනතාවට සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | ප්‍රාදේශීය සභාව විසින් සලසන සේවාවන් අනෙකුත් දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණය විම හේතුවෙන් ප්‍රමාදයන් සිදු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 11 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | අනුමත තනතුරු වලට සමාන නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව දරන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති ඉඩම්වලින් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලි වලින් වරිපනම් බදු අයකිරීමට වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2018 වර්ෂයේ දේපල සඳහා “K” ආකෘති පත්‍ර 20,525ක් නිකුත් කර නොතිබුණි. | “K” ආකෘති පත්‍ර නියමිත කාලයේ නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | “K” ආකෘති පත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට 1999 අගෝස්තු 20 දින ලබාදී තිබූ අංක 252-6555 දරන පිකප් වාහනය සභාවේ සභාපතිවරයා විසින් එම වාහනය 2017 | මෙම වාහනය ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහනය ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | පෙබරවාරි 03 දින සභාවේ ලේකම්වරයාට ආපසු භාර දී නොතිබූ බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂ 15ක් පුරා මෙම වාහනය ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි | | |
| (ආ) | එකතුව රු. 13,775,306ක් වටිනා දේපළ 12ක් මේ දක්වා සභාවට පවරා ගෙන නොතිබුණි. | දේපළ සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | දේපළ සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | සභාව විසින් වාහන 02ක් වර්ෂ 13ක් පුරා භාවිතා කර තිබුණත් ඒවා සභාවට පවරා ගෙන නොතිබුණි. | වාහන සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | වාහන පවරා ගැනීමට කටයුතු කෙරේ. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක EPJZ-8305 දරන බවුසරය, ලියාපදිංචි නොකළ බවුසරය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | බවුසර සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතුවේ. | සභාවට පවරා ගැනීමට කටයුතු කර ඇත. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය වියදම් සැසඳීමේදී රු.32,480,193කින් හිතකර ලෙස බලපා තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරියේදී අයවැය ඵලදායි අන්දමින් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් වන ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව, සහනාධාර, ආදි තථ්‍ය වියදම්වලින් වැඩි ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. මේ අනුව ඵලදායි නොවූ එකක් ලෙස අයවැය දක්නට ලැබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරියේදී අයවැය ඵලදායි අන්දමින් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |